**ජාතික මූලික අධ්‍යයන ආයතනය - 2021**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික මූලික අධ්‍යයන ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | **අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 65 ඡේදය අනුව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණු අතර පිරිවැය රු.62,452,454 ක ජංගම නොවන වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තු දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ආයතනයේ ජංගම නොවන වත්කම්වල මූලික තක්සේරු කටයුතු අවසන් කර ඇති අතර අනෙකුත් තක්සේරු වාර්තා ලද පසු මූල්‍ය වාර්තාවල අදාළ ගැලපීම් සිදු කරනු ඇත. ඒ අනුව තවදුරටත් භාවිතයට ගනු ලබන ජංගම නොවන වත්කම්වල අගයන් ප්‍රතිශෝධනය වනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ආයතනය විසින් පේටන්ට් බලපත්‍ර 03 ක් ලබාගෙන තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 20 අනුව ඒවායේ වටිනාකම තක්සේරු කර අස්පෘශ්‍ය වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ආයතනයේ පේටන්ට් බලපත්‍රව ටිනාකම් ගිණුම්ගත කිරීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනයට අයත් නොවන රු.900,712 ක වත්කම් විෂයයන් 09 ක්, ජංගම හා ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | ආයතනයට අයත් නොවන හා බාහිර පාර්ශවයන් විසින් පරිහරණය කරනු ලබන රු.900,712 ක් වටිනා වත්කම් සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡාවන් සිදුවෙමින් පවතින අතර අදාළ නිවැරදි කිරීම් සිදු කෙරෙනු ඇත. | ආයතනයට අයත් නොවන වත්කම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොකළ යුතුය. |
| (ආ) | 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පර්යේෂණ ව්‍යාපෘති සඳහා වැය කර තිබුණු රු.1,097,477 ක් අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගත යුතු වුවද, ඒ වෙනුවට පුස්තකාල පොත් යටතේ ගිණුම්ගත කර තිබුණි. | පර්යේෂණ කටයුතු සඳහා වන පිරිවැය ගිණුම්ගත කිරීමට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සකස් කිරීම පිළිබඳව අධ්‍යයන කටයුතු සිදු වීමෙන් ඉක්බිතිව නිවැරදි වනු ඇත. | පර්යේෂණ හා සංවර්ධන පිරිවැය අදාළ ගිණුම්කරණ ප්‍රමිතිය අනුව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 2015 වර්ෂයේදී ආයතනය සතු ඉඩම් හා ගොඩනැගිලි රු.514,800,000 කට ප්‍රත්‍යාගණනය කර තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම එම ප්‍රත්‍යාගණන අගයන් ගිණුම්ගත කර නොතිබුණි. | රජයේ තක්සේරු දෙපාර්තුමේන්තුව විසින් ලබා දී ඇති තක්සේරු වටිනාකම් අනුව ආයතනයේ ඉඩම් හා ගොඩනැගිලි ගිණුම්වල ගැලපීම් කර නිවැරදි කරනු ඇත. | ස්ථාවර වත්කම්වල තක්සේරු වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

### 1.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| | 2.8.4 මාර්ගෝපදේශය | තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු.4,320,000 ක සනීපාරක්ෂක සේවා සහ ආපනශාලා කටයුතු සඳහා වන ගිවිසුම්වලට එළඹ තිබුණි. තවද තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයකින් තොරව පිරිවැය රු.451,679 ක | මෙම වරද පිළිගන්නා අතර 2022 වර්ෂයේ සිට ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිවැරදිව සිදු කිරීමට කටයුතු යොදා ඇති බව දන්වමි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝප දේශ අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | විද්‍යුත් උපකරණ 08 ක් මිලදී ගෙන තිබුණි. | | |

(ආ) චක්‍රලේඛ
----------

| | | | | |
|---|---|---|---|---|
| i. | 1978 දෙසැම්බර් 10 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මුළු පිරිවැය රු.1,083,853,325 ක ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | 2021 වර්ෂය සඳහා වාර්ෂික භෞතික සත්‍යාපන කටයුතු නිම වූ පසු ස්ථාවර වත්කම් සඳහා ලේඛන සකස් කිරීමට සහ පරිගණක ගත කරන ලද තොරතුරු ලේඛනගත කිරීමටද කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. |
| ii. | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය | මුදල් වර්ෂය අවසන්වී දින 150 ක් ඇතුළත ආයතනයේ විගණන වාර්තාව සමඟ පසුගිය වර්ෂයේ කාර්යසාධනය ඇතුළත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද, ඉකුත් වර්ෂයට අදාළ වාර්ෂික කාර්යසාධන වාර්තාව 2021 දෙසැම්බර් 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | සංයුක්ත සැලැස්ම පිළියෙල කර පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර, විගණකාධිපති, භාණ්ඩාගාරය, රේඛීය අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 74,976,627 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.65,305,466 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,671,161 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. මෙම පිරිහීමට පුනරාවර්තන ප්‍රදාන හා වෙනත් ආදායම් අඩු වීම හා සැපයුම්, පරිභෝජන වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-----------------------------------**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------------------- | ----------------------------------------- | ------------------------ |
| (අ) | ආයතනයේ විදුලි කාර්මිකයෙකු, යන්ත්‍ර ක්‍රියාකරවන්නන් දෙදෙනෙකු හා පුහුණුව නොලත් සේවකයින් 03 දෙනෙකු මෙන්ම රාත්‍රි කාලයේදී ආයතනයේ ආරක්ෂක නිලධාරීන් 03 දෙනෙකු සේවයේ යොදවා සිටියදී, ආයතනයේ ජල කරාම විවෘත කිරීම හා විදුලිය විසන්ධි වන | ඉදිරි වර්ෂයේදී මෙම ටෙන්ඩරය සඳහා පුවත් පත් දැන්වීම පලකරන විට නිසි ආකාරයෙන් දැන්වීම පළ කර නිවැරදිව ගිවිසුම් ගත කිරීමක් සිදු කිරීමට අදහස් කරනු ලැබේ . | ආයතනයේ මානව සම්පත ප්‍රශස්ත අයුරින් උපයෝජනය කිරීමටත්, රජයේ මුදල් අරපිරිමැස්මෙන් භාවිතා කිරීමටත් කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | අවස්ථාවලදී විදුලි ජනක යන්ත්‍රය ක්‍රියාත්මක කරවීම සඳහා ආපනශාලා භාරකරු වෙත 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා මාසිකව රු.25,000 බැගින් රු.3,075,000 ක් ගෙවා තිබුණි. | | යුතුය. |
| (ආ) | ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත රු.1,958,002 ක් ගෙවා ආයතන පරිශ්‍රය පිහිටි භූමියේ පාංශු විශ්ලේෂණයක් කර තිබුණු නමුත් එම වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට වසර 03 ක පමණ කාලයක සිට ප්‍රමාදකර තිබීම හේතුවෙන් ආයතනයේ ගොඩනැගිලිවල, කාර්යය මණ්ඩලයේ සහ ආයතනය අවට දේපළ හා ජනතාවගේ ආරක්ෂාව අවදානමක පැවතුණි. | පාංශු විශ්ලේෂණය සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙතින් ලබා දී ඇති වාර්තාවට අනුව පැති බැම්මක් ඉදි කිරීමට අවශ්‍ය කටයුතු අදාළ අමාත්‍යාංශය මගින් දැනටමත් සිදු කරමින් පවතී. | අදාළ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී රු.474,975 ක් වැයකර මිලදී ගෙන තිබුණු ජෛව ප්‍රතික්‍රියාකාරක (Bioreactor 300L) උපකරණය කළමනාකරණ මණ්ඩල අනුමැතියකින් තොරව හා ගාස්තු අය කිරීමකින් තොරව පෞද්ගලික ආයතනයකට ලබාදී තිබුණි. | මෙම උපකරණ ආයතනය වෙත ලැබුනු ප්‍රදානයන් (Grant) වලින් ගත් උපකරණයක් වේ.එම ප්‍රදාන සැපයූ ආයතනයේ උපදෙස් මත නිකුත් කිරීම සිදු කර ඇත. 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිමවූ පසුව ප්‍රදානයන් (Grant) මත ලබා ගත් උපකරණ වෙනමම ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. | විධිමත් අනුමැතියක් මත පමණක් බාහිර පාර්ශවයන් වෙත වත්කම් ලබා දිය යුතුය. |
| (ඈ) | නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ක්‍රියාත්මක කර තිබුණු ඒකාබද්ධ මෘදුකාංග පද්ධතිය (integrated software) අතරමඟ නතර කිරීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින කළමනාකරණ මණ්ඩලය තීරණය කර තිබුණු නමුත් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු රු.660,000 ක අත්තිකාරම් මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඒකාබද්ධ මෘදුකාංග පද්ධතිය පිහිටුවීම සඳහා සකස් කරන ලද ගිවිසුමට අනුව මෘදුකාංග පද්ධතියේ කටයුතු ආරම්භ කිරීමට පෙර, අත්තිකාරම් මුදලක් ගෙවීමට එකඟවී ඇත. ඒ අනුව පද්ධතිය සකස් කිරීමට පෙර ගිවිසුම් ප්‍රකාරව මුදල් ගෙවා ඇති අතර, පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවන බවට තීරණය වනවිට අත්තිකාරම් මුදල් ගෙවා අවසන්ව තිබුණි. | ගෙවා ඇති අත්තිකාරම් මුදල් පියවාගත යුතුය. |
| (ඉ) | විධිමත් අනුමැතියකින් තොරව නිලධාරින් 09 දෙනෙකු දෛනිකව දිගන ප්‍රදේශයේ පිහිටි රජයේ නිවාසවල සිට ආයතනය දක්වා ප්‍රවාහනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.558,672 ක් වැයකර තිබුණි. | මෙම ගැටලුව ඉදිරි පාලක මණ්ඩලය වෙත යොමු කර ගාස්තු සංශෝධනයට නිසි ක්‍රමවේදයක් හෝ මෙම ප්‍රවාහන සේවාව ඉදිරියට පවත්වාගෙන යාම පිළිබඳව තීරණය කිරීමට බලාපොරොත්තු වෙමි. | මේ සම්බන්ධයෙන් විධිමත් අනුමැතියන් ලබා ගැනීමට හා කාලීනව ගාස්තු සංශෝධනයට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාත්මක වෙමින් පැවති පර්යේෂණ ව්‍යාපෘති 18 කට අදාළ ලිපිගොනු හා ලියකියවිලි විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ව්‍යාපෘති ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම, මූල්‍ය හා පරිපාලන කටයුතු හා ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු විගණනය සඳහා ලබාගත නොහැකි විය. | එක් එක් පර්යේෂණ ව්‍යාපෘතිය ආරම්භක වර්ෂයේ සිට අත් කරගෙන ඇති භෞතික ප්‍රගතිය සහ ජයග්‍රහණ දක්වා ඇති අතර 2012 වර්ෂයේ සිට පර්යේෂණ ව්‍යාපෘති සඳහා හඳුනාගත හැකි මූල්‍ය වියදම් අවසාන ගිණුම යටතේ දක්වා ඇත. | විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු ඉදිපත් කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.47,485,576 ක් වැය කර ක්‍රියාත්මක කරමින් තිබුණු ක්වොන්ටම් භෞතික විද්‍යාව හා ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික ("Quantum Physics and Applied Electronic") පර්යේෂණ ව්‍යාපෘතිය භාර විද්‍යාඥවරයා 2020 සැප්තැම්බර් 02 දින ආයතනයෙන් ඉල්ලා අස්වී තිබීම හේතුවෙන් එම පර්යේෂණ ව්‍යාපෘතිය තවදුරටත් ක්‍රියාත්මක නොකර අතහැර දමා තිබුණි. | Quantum Physics and Applied Electronic" පර්යේෂණ ව්‍යාපෘතියෙහි පර්යේෂණ විද්‍යාඥ මහාචාර්ය ආසිරි නානායක්කාර මහතා 2020 සැප්තැම්බර් මාසයේදී ඉල්ලා විය. ඒ මහතා ඉල්ලා අස්වන අවස්ථාව වන විට එම පර්යේෂණ වැඩසටහන යටතේ අඛණ්ඩ පර්යේෂණ ව්‍යාපෘතියක් නොතිබූ අතර, පර්යේෂණ සහකාරවරයෙකු සේවයේ යෙදී සිටියේ ද නැත. එබැවින් ඒ මහතා ඉල්ලා අස් වූ අවස්ථාවේ වෙනත් විද්‍යාඥවරයෙකුට එම වැඩසටහන භාර දීම සිදු නොවුණි. | අපේක්ෂිත අරමුණු ඉටු කරගත හැකි වන අයුරින් පර්යේෂණ අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය. |

## 3.3 අරමුදල් ඌන උපයෝජන

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ආයතනයේ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ඒකාබද්ධ මෘදුකාංග පද්ධතියක් (Intergraded Software) ස්ථාපනය කිරීම වෙනුවෙන් 2018 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.6,864,960 ක පරිගණක හා පරිගණක උපාංග අතරින් රු.1,680,560 ක පරිගණක උපාංග සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඌන උපයෝජිතව පැවතුණි. | මෙම පරිගණක සහ උපාංග මිළදී ගනු ලැබුවේ ඒකාබද්ධ මෘදුකාංග පද්ධතිය සඳහාම පමණක් නොව, ඒ වන විට ආයතනයේ විවිධ අංශවල පැවති පරිගණක අවශ්‍යතා හේතුවෙන් වන අතර දැනටමත් එම පරිගණක සහ උපාංග ඒ ඒ අංශවල පරිගණක අවශ්‍යතා සඳහා යොදවා ඇත. | පරිගණක උපාංග ඵලදායි අයුරින් උපයෝජනය කළ යුතුය. |
| (ආ) | ප්‍රාග්ධන ව්‍යාපෘති 04 ක් සඳහා ලැබී තිබුණු එකතුව රු.36,166,934 ක අරමුදල් අදාළ කාර්යයන් සඳහා ඵලදායී ලෙස උපයෝජනය නොකර, ඉකුත් වර්ෂයේ සිට ඉතුරුම් ගිණුමක තැන්පත් කර තිබුණි. | මෙම අරමුදල් ඉදිරියේදී ඵලදායී ලෙස උපයෝජනය කිරීමට මේ වන විටත් සැලැසුම් කර කටයුතු ආරම්භ කර ඇත. | අරමුදල් අදාළ කාර්යයන් සඳහා ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුවී තිබුණු නමුත්, ඒ සඳහා සුදුසු අයකු බඳවාගෙන නොතිබුණු අතර එම කාල පරිච්ඡේදය තුළ අභ්‍යන්තර විගණනයක් සිදු කරද නොතිබුණි. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2020 ට අනුව අත්‍යාවශ්‍ය පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් කිරීමට පියවර ගෙන ඇත. | අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගෙන අභ්‍යන්තර විගණන කටයුතු ප්‍රශස්තව පවත්වා ගෙන යා යුතුය. |